**ශීර්ෂය 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජුනි 22 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

-----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරි විසින් විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දැරූ බව. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම. | 2.2.1 |
| | | 2. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම. | 2.2.2 (අ) |
| | | 3. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම | 2.3.1 |
| | | 4. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.8 (අ), (ආ) |
| | | 5. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.10 |
| | | 6. අභ්‍යන්තර විගණන වැඩසටහන් මඟින් සියලු විගණන කටයුතු ආවරණය නොවීම. | 2.13 |
| | | 7. මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.2.2 (ඉ) |

| | | | |
|---|---|---|---|
| 128(1) (ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. ප්‍රධාන කාර්යයන්ට පටහැනි කාර්යයන්<br>2. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.2.2 (ආ)<br>2.2.2 (ඇ), (ඈ) |
| 128(1) (ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.<br>2. අනුකූල නොවීම් | 2.11<br>2.12 |
| 128(1) (ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිරාදී උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.4 |

| | | | |
|---|---|---|---|
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. කළමනාකරණ දුර්වලතා<br>2. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු | 2.7<br>2.3.2(අ)(ආ)(ඇ) |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | 1. පාඩු හා හානි<br>2. මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.6<br>2.15 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ
---------------------------------------------

### 2.1 කාර්යසාධනය
-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඉඟුරු සහ කහ භෝග පිළිවෙළින් හෙක්ටයාර් 1883 ක් හා හෙක්ටයාර් 932 ක් වැනි අඩු වපසරියක් වගා කර තිබුණි. මෙම භෝගවල ආනයන පරිමාව 2016 වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින් සියයට 329.4 කින් හා සියයට 6.4 කින් වර්ධනය වී තිබුණි. එසේ වුවද ඵලදායිතා සංවර්ධන වැඩසටහන අනුව අඩු නිෂ්පාදනයක් පෙන්නුම් කරන අපනයන භෝගවල ඒකක වපසරිය වැඩි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතුව මධ්‍යම පැළ තවාන් 10 ක් පැවතියද එය මුළු පැළ අවශ්‍යතාවයෙන් පැළ නිකුත් කිරීම 930489 ක් හෙවත් සියයට 3.5 ක් වැනි අඩු ප්‍රමාණයක් විය. ඒ අනුව මධ්‍යම පැළ තවානෙහි කටයුතුවල කාර්යසාධනය අඩු මට්ටමක පැවතුණි.

### 2.2 සැලැසුම් කිරීම
------------------

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 74.2 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු කාර්යයන් 04 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකරකම් ළඟා කර ගන්නා කාල වකවානුව සඳහන් කර නොතිබීම හේතුවෙන් අක්මුදල් අවශ්‍යතා සැලැස්මේ නිවැරදිභාවය තහවුරු නොවුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සැලැසුම් ක්‍රියාත්මක වන කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් ප්‍රතිඵල ක්‍රියාකාරි සැලැස්මෙහි අතුළත් කර නොතිබුණි.

### 2.2.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරිම**

---

(i) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් කාර්යභාරයන් 06 ක්, රු.මිලියන 600 ක අපේක්ෂිත පිරිවැය ඉලක්කයක් සහිතව ඉටු කර ගැනීමට සැලැසුම් කර තිබුණද (හිඟ බිල්පත් පියවීමද ඇතුළුව) එම කාර්යයන්වල රු.මිලියන 271.92 ක් වටිනා වැඩ කොටස් පමණක් ඉටුකර නොතිබුණි.

(ii) ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් ප්‍රධාන වැඩසටහන් 03 ක් යටතේ උප ව්‍යාපෘති 08 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කිරිමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

---

දෙපාර්තමේන්තුව විසින් ක්රියාකාරි සැලැස්ම පිළියෙළ කිරිමේදී එහි ප්‍රධාන කාර්යයන්වලින් බැහැරව පෙර වර්ෂයේ බිල්පත්වලට ගෙවීම් ලෙස රු. මිලියන 22 ක වටිනාකමක් ඇතුළත් කර තිබුණි.

**(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් ප්‍රධාන වැඩසටහන් 04 ක් යටතේ උප ව්‍යාපෘති 10 ක් සඳහා රු.මිලියන 152.05 ක් වෙන්කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ප්‍රතිඵල අත්කර නොගැනීම නිසා රු.මිලියන 114.73 කට උපයෝජනය කර නොතිබුණි.

**(ඈ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

---

වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු කාර්යභාරයන් 06 ක් ඉටුකිරීම සඳහා විවිධ ව්‍යාපෘති 57 ක් වෙනුවෙන් රු.මිලියන 600 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එම කාර්යයන්වල කාර්යසාධන දර්ශක සඳහන් කර නොතිබුණු නිසා කාර්යසාධනය අපේක්ෂිත පරිදි ඉටු කර තිබුණු බව තහවුරු කර ගැනීමට නොහැකි වුණි.

(ඉ) **මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**
-------------------------------------------------------------------

මාතලේ පර්යේෂණ මධ්‍යස්ථාන භූමියේ 2015 ජූලි 04 දින ආරම්භ කරන ලද කුළුබඩු උද්‍යානය තුළ කුළුබඩු තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2016 හා 2017 වර්ෂවල පිළිවෙළින් රු.මිලියන 2 ක් හා රු.මිලියන 7 ක් වෙන්කර තිබුණද එම ව්‍යාපෘති කටයුතු 2017 අගෝස්තු මාසය වන විටත් ආරම්භ කර නොතිබුණි.

## 2.3 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම
----------------------------------

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් වැය විෂයයන් 11 ක් වෙනුවෙන් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 676.90 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 403.16 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සඳහා පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැසුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය අනුව වර්ෂ 03 ක් වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් නොකර වර්ෂයක් සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) මාර්ගෝපදේශය අනුව එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමාණුගතව විස්තර වන පරිදි ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබුණි.

### 2.3.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම
-----------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර ගම්මිරිස් සමුළුවේ 45 වන සැසිය වෙනුවෙන් රු.මිලියන 5.78 ක් වටිනා සේවා ලබාගැනීමට අදාළ ලංසු පිරිනැමීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.10 මාර්ගෝපදේශය පරිදි සියලු පිරිවිතර සම්පූර්ණ කළ අවම මිල සහිත ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට ලංසු පිරිනැමීම සිදුකර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (අ) මාර්ගෝපදේශයේ විධිවිධානවලින් බැහැරව රු.මිලියන 6.23 ක් වටිනා කාර්යයන් වෙනුවෙන් යුතු රු.311,359 ක් වටිනා කාර්යසාධන සුරක්ෂණය ලබාගෙන නොතිබුණි.

(ඇ) ජාත්‍යන්තර ගම්මිරිස් සමුළුවේ 45 වන සැසිය මෙහෙයවීමේ කටයුතු වෙනුවෙන් රු.මිලියන 2.03 ක් වටිනා සේවා ප්‍රසම්පාදනයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 මාර්ගෝපදේශය පරිදි ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප නොකර ඇගැයීමට ලක්කර තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.2 මාර්ගෝපදේශය පරිදි විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කිරීමෙන් තොරව ජාත්‍යන්තර ගම්මිරිස් සමුළුවේ 45 වන

සැසිය වෙනුවෙන් හෝටල් පහසුකම් හා සැසිය මෙහෙයවීමේ කටයුතු වෙනුවෙන් රු.මිලියන 7.80 ක් ගෙවා තිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුව විසින් විවෘත ටෙන්ඩර් මඟින් කුළුබඩු අලෙවි කිරීමේ දී පසුගිය වසර තුනක කාලයක් තුළ වූ ප්‍රසම්පාදන තීරණවලට අනුකූල නොවී රු.මිලියන 1.82 ක් වටිනා කුළුබඩු කි.ග්‍රෑ. 4138.22 ක් අනුමැතියකින් තොරව අලෙවි කර තිබුණි.

(ඊ) ප්‍රසම්පාදන උපදෙස් හා කොන්දේසි පත්‍රිකාවේ සඳහන් උපදෙස් අනුව කුළුබඩු අලෙවි කිරීමේ දි මුදල් එකවර ගෙවා සියලු ද්‍රව්‍ය ප්‍රධාන කාර්යාල භූමියෙන් ඉවත්කර ගතයුතු වුව ද පසුගිය වර්ෂ 03 ක කාලයක් තුළ මුදල් එකවර නොගෙවා මාසයකට අධික කාල ප්‍රමාදයක් සහිතව කුළුබඩු ද්‍රව්‍ය ඉවත් කර ගෙන තිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

----------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) ඉන්ධන දහනය වීම් පරීක්ෂා නොකිරීම

-------------------------------------------

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුව තිබුණ ද වාහන 118 කට අදාළව සමාලෝචිත වර්ෂයේ හෝ ඊට පෙර වසරේදී ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

### (ආ) මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය

-------------------------------------------------

(i) දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන 10 ක් ලබාගෙන තිබුණු අතර කල්බදු වාරික වශයෙන් වර්ෂය තුළ රු.15,651,700 ක්ද, ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.2,185,401 ක් ද වශයෙන් ඒ සඳහා දරන ලද මුළු වියදම රු. 17,837,101 ක් වී තිබුණි. කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහනවලින් කිලෝ මීටර් 206234 ක් ධාවනය කර තිබුණි. ඒ අනුව එම වාහන වලින් එක් කිලෝ මීටරයක් ධාවනය කිරීම සඳහා රු. 86.49 ක් වැය කර තිබුණි.

(ii) 2017 මාර්තු 22 දිනැති කල්බදු වාහන ලබා ගැනීම සඳහා වූ ගිවිසුමේ 03 ඡේදය අනුව සෑම වාහනයක්ම මසකට කි.මී.3000 ක් ධාවනය කළ යුතු අතර වාහන 08 ක් සඳහා මසකට රු. 163,500 බැගින්ද අනෙක් වාහන 02 ක සඳහා රු.165,000 ක් හා රු.198,000 ක් ද වශයෙන් කල්බදු වාරික ගෙවිය යුතු විය. 2017 අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා කාලයට අදාළව කල්බදු වාරික වශයෙන් වාහන 10 ක් සඳහා එකතුව රු.15,651,700 ක් ගෙවා තිබුණි. එහෙත් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන 10 න් 07 ක් කිසිදු මාසයක කි.මී.3000 ක්

ධාවනය කර නොතිබුණු අතර ඉතිරි වාහන 03 ද මාස 07 ක් පමණ කි.මී. 3000 ට වඩා අඩු දුරක් ධාවනය කර තිබුණි.

**(ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරික්ෂණවලදී නිරික්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම රු. | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|---|
| (i) | ඉඩම්(හෙක්ටර්යාර) | අක්කර 51.72 | තහවුරු කරගත නොහැක | තහවුරු කරගත නොහැක |
| (ii) | ගොඩනැගිලි | වර්ග අඩි 603 | - එම- | 2017 මාර්තු 22 සිට |
| (iii) | මෝටර් වාහන | 04 | -එම- | තහවුරු කරගත නොහැක |

**(ඈ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබුණු අවස්ථා නිරික්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් සංඛ්‍යාව/ ඒකක ගණන/ ප්‍රමාණය | වත්කම් ලබා දී ඇති ආයතනය | වටිනාකම රු. | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| මාතලේ පල්ලේපොල ව්‍යාප්ති රජයේ නිවාසය | පල්ලේපොළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඉදිරිපත් කර නොමැත | 2003 වසරේ සිට |
| මාතලේ, හුණුකැටඇළ ව්‍යාප්ති නිලධාරි රජයේ නිවාසය | අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඉදිරිපත් කර නොමැත | 2004 වසරේ සිට |

**(ඉ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව පැවති ඉඩම් ඒකක 40 ක් හා වාහන 33 ක් විධිමත් පරිදි පවරා නොගෙන දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**2.5** **බැඳීම් හා බැරකම්**

--------------------

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැරකම් වලට එළඹීම**

-------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 94 (2) හි විධි විධානවලින් බැහැරව දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 2.26 ක් වටිනා මූලධන වැය විෂයයන් 06 කට අදාළව ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳී තිබුණි.

(ii) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධි විධානවලින් බැහැරව දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 120.7 ක බැරකම්වලට බැඳී තිබුණි.

**2.6** **පාඩු හා හානි**

---------------

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර ගම්මිරිස් සමුළුවේ 45 වන සැසිය වෙනුවෙන් හෝටල් පහසුකම් ලබාගැනීමේදී රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.10 මාර්ගෝපදේශය පරිදි අවම මිල හා සියලු පිරිවිතර ගැලපී ලංසු ඉදිරිපත් කළ ආයතනයට ලංසු පිරිනැමීම සිදු නොකිරීමෙන් රු.411,000 ක අලාභයක් සිදුවී තිබුණි.

**2.7** **කළමනාකරණ දුර්වලතා**

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අඩු භෝග සනත්වය හා දුර්වල භෝග කළමනාකරණය හේතුවෙන් අඩු නිෂ්පාදනයක් පෙන්නුම් කරන කෘෂි වගාවල ඒකක වපසරිය වැඩිකළ හැකි වුවද පර්යේෂණ කටයුතු සිදු කර බුලත් වගා කළ යුතු වපසරිය වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විවෘත ටෙන්ඩර් මඟින් නිෂ්පාදිත කුළුබඩු අලෙවි කිරීමේ දී කොන්දේසි කඩ කරනු ලබන ටෙන්ඩර්කරුවන් ප්‍රසම්පාදන උපදෙස් හා කොන්දේසි පත්‍රිකාව අනුව අසාධු ලේඛන ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නිෂ්පාදිත කුළුබඩු අලෙවි කිරීමෙන් රු.මිලියන 13.09 ක ආදායමක් ලබාගනු ලැබුවද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු ඉටුවන ආකාරයට කුළුබඩුවල ගුණත්වය ආරක්ෂාවන පරිදි ඇසුරුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට කුළුබඩු ශ්‍රේණිගත දත්ත පද්ධතියක් සකස් කර ඉදිරිපත් කර තිබියදීත් පසුගිය වර්ෂ 03 ක කාලය තුළ ටෙන්ඩර් වටිනාකම රු.මිලියන 11.61 ක් වූ නිෂ්පාදිත කුළුබඩු ශ්‍රේණිගත කිරීමකින් තොරව අලෙවි කර තිබුණි.

(ඉ) 2012 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ සියයට 55 ක ප්‍රමාණයකින් පොල් අස්වැන්න අඩු වීමට හේතු වූ කරුණු නාරම්මල අතුරු වගා හා බුලත් පර්යේෂණ ආයතනය විසින් විග්‍රහ කර විසඳුම් නිර්දේශ කර නොතිබුණි.

(ඊ) අතුරු වගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථාන භූමියේ වගාකරන ලද පොල් අස්වැන්න අලෙවි කිරිමේ දී ස්වාධින මිල කමිටුවක් පත් කර වෙළඳපොළ තුළ පවතින පොල් මිල ගණන් තක්සේරුවක් සිදු කර නොතිබුණි.

**2.8 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය<br>රු. මිලියන | උපයෝජනය<br>රු. මිලියන | ඉතිරිය<br>රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2013 | පුනරාවර්තන | 329.19 | 326.13 | 3.06 | 0.92 |
| | මූලධන | 415.80 | 244.92 | 170.88 | 41.10 |
| | එකතුව | 744.99 | 571.05 | 173.94 | 23.35 |
| 2014 | පුනරාවර්තන | 407.64 | 407.35 | 0.29 | 0.07 |
| | මූලධන | 380.65 | 300.05 | 80.60 | 21.17 |
| | එකතුව | 788.29 | 707.40 | 80.89 | 10.26 |
| 2015 | පුනරාවර්තන | 564.67 | 549.55 | 15.12 | 2.68 |
| | මූලධන | 428.10 | 416.57 | 11.53 | 2.69 |
| | එකතුව | 992.77 | 966.12 | 26.65 | 2.68 |
| 2016 | පුනරාවර්තන | 603.31 | 566.76 | 36.55 | 6.06 |
| | මූලධන | 503.70 | 431.45 | 72.25 | 14.34 |
| | එකතුව | 1,107.01 | 998.21 | 108.80 | 9.83 |
| 2017 | පුනරාවර්තන | 604.20 | 604.13 | 0.07 | 0.01 |
| | මූලධන | 674.20 | 400.52 | 273.68 | 40.59 |
| | එකතුව | 1,278.40 | 1,004.65 | 273.75 | 21.41 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මූලධන වියදම් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 59 ක් ද පුනරාවර්තන ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 99.98 ක් ද උපයෝජනය කර තිබුණි. ඒ අනුව ආයතනයේ අරමුණු කරා ළඟා වීමට වඩා වැඩි පිරිවැයක්, ආයතනය පවත්වා ගැනීම සඳහා දරා තිබුණි.

(ආ) විසර්ජන ගිණුම

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

  -------------------------------------------------------

  මූලධන වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.මිලියන 626.6 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 263.21 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණු අතර, එම ඉතිරිවීම ප්‍රතිපාදනයෙන් සියයට 18 සිට සියයට 42 ක පරාසයක් තුළ පැවතුණි. ප්‍රතිපාදන ඉතිරිවීම්වල දක්වා තිබුණු හේතු අනුව අදාළ කාර්යයන් කාර්යක්ෂමව ඉටුකර නොතිබුණු අතර සමහර කාර්යයන් ආරම්භ කිරීමටවත් පියවර ගෙන නොතිබුණු බව විගණනයේදී අනාවරණය විය.

- එක් වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.10,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

**2.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**---------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**----------------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාළ විෂයය අංක 28901 දරන රජයේ නිළධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 45.00 | 44.03 | 28.00 | 28.61 | 105.00 | 94.32 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ 2017 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අය වීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු1,105,438 ක් වී තිබුණි. එම හිඟ හිටි ශේෂ මාස 04 සිට වර්ෂ 05 ට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබුණත් හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(ආ) විධිවිධානවලට පටහැනිව ණය නිකුත් කිරීම**

දෙපාර්තමේන්තුව විසින් ණය ගෙවීමේ දි පිළිපැදිය යුතු විධි විධානය අනුගමනය නොකර අවස්ථා 02 කදී නිලධාරීන් වෙත ගෙවන ලද ණය මුදලින් රු.563,550 ක ණය ශේෂ අයකර ගෙන නොතිබුණි.

## 2.10 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවට අදාළ අංක 7002/0000/00/0087/0017/000 දරන අග්‍රිම ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.2,536 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) හි සඳහන් විධිවිධානයන්ගෙන් බැහැරව මාණ්ඩලික නොවන නිලධාරින් 08 දෙනෙකුට අවස්ථා 15 කදී එකතුව රු.624,520 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්යය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 08 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු.431,850 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාස 01 සිට මාස 03 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් නිරවුල් කර තිබුණි.

(ඇ) උක්ත චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක් වුවද අවස්ථා 16 කදී නිලධාරීන් 11 දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා එකතුව රු.514,303 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි.

(ඈ) අවස්ථා 11 කදී ලබා දුන් රු. 420,579 ක අත්තිකාරම් මුදල කිසිදු කාර්යයකට යොදා නොගෙන අත රඳවාගෙන සම්පූර්ණ මුදලම පියවා තිබුණු අතර රජයේ මුදල් අතරඳවා ගැනිම් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 6.2 හා 6.7 වගන්ති අනුව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) අත්තිකාරම් ලබා දීමේ දී නිවැරදි ඇස්තමේන්තු සකස් කර නොතිබීම නිසා අවස්ථා 16 කදී නිලධාරින්ට ලබා දුන් රු.563,220 ක අත්තිකාරම් මුදලින් රු.302,681 ක් හෙවත් සියයට 33.4 ක සිට සියයට 73.84 ක් දක්වා පරාසයක මුදල් ප්‍රමාණයක් නැවත පියවා තිබුණි.

(ඊ) නිශ්චිත කාර්යයක් වෙනුවෙන් නිලධාරින්ට ලබා දුන් රු.100,000 ක අත්තිකාරම් මුදල පියවීමේ දි නිලධාරින් 09 දෙනෙකු විසින් එම සීමාව ඉක්මවා රු.439,367 ක මුදලක් තම පෞද්ගලික මුදලින් වියදම් කර පසුව දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර තිබුණි.

## 2.11 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) අනුව එහි 11 වැනි පරිශිෂ්ඨය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ඈ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ඉ) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647(ඇ) |
| (ඊ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |
| (උ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |

| | | |
|---|---|---|
| (ඌ) | වෘක්ෂලතා ලේඛනය | 2015 අගෝස්තු 5 දිනැති චක්‍රලේඛ අංක 2/2015/ගිණුම් දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය |
| (එ) | අස්වනු ලේඛන හා ඵලදා ලේඛන | 2015 අගෝස්තු 5 දිනැති චක්‍රලේඛ අංක 2/2015/ගිණුම් දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය |

**2.12 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| | XV වැනි පරිච්ඡේදයේ 4.8 වගන්තිය | 15,471,650 | නිලධාරින් දෙදෙනෙකු වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගනිමින් විදේශගත වීමේ දී බැඳුම්කරවල ඇපකරු වශයෙන් අත්සන් කරන පුද්ගලයන්ගේ දේපළ පිළිබඳව තහවුරු කිරීමක් ලබාගෙන නොතිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | මුදල් රෙගුලාසි 177(4) හා 491 (අ) | - | මාස්පතා "ලෙටර් එච්" ගිණුමක් පිළියෙළ කොට එය ගණන්දීමේ නිලධාරියාගේ මාර්ගයෙන් මුදල් රෙගුලාසි 491(අ) ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) **ජාතික අයවැය චක්‍රලේඛ**

2016 දෙසැම්බර් 28 දිනැති අයවැය චක්‍රලේඛ අංක 5/2016 - මුල් කාර්තුව තුළ ප්‍රසම්පාදන කටයුතු සිදුකර අවසන් කර නොතිබුණි.

(ඈ) **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| 2017 ජුලි 05 දිනැති අංක 256/2017 දරන චක්‍රලේඛය. | 426,135 | (i) | වෙනත් කාණ්ඩ 03 ක් යටතේ ඇතුළත් කළ යුතු නිලධාරින් තුන් දෙනෙකුගේ ණය ශේෂ එකම කාණ්ඩය යටතේ දක්වා තිබුණි. |
| | 188,120 | (ii) | නිලධාරින් 04 දෙනෙකුගේ ණය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.13 අභ්‍යන්තර විගණනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ 07 වගන්තිය ප්‍රකාරව පද්ධති විශ්ලේෂණය හා කාර්ය සාධන විශ්ලේෂණය කෙරෙහි දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් අවධානය යොමු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කිරීමේදී වඩාත්ම අවදානම් සහිත ක්‍රියාවලින් පරීක්ෂාව කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) **අභ්‍යන්තර පාලනය**

මාතලේ පර්යේෂණ ගොවිපළේ ප්‍රධාන ගබඩාවට ගොවිපළ අංශයෙන් ලැබෙන තොග වෙනුවෙන් භාණ්ඩ ලැබීම් තුණ්ඩු නිකුත් කර නොතිබුණු අතර ගොවිපළ අංශයෙන් ද ගබඩාව වෙත භාරදීම් පිළිබඳ විස්තර නොමැති බැවින් එළදා නෙළීම, සැකසීම, වියළීම වැනි කටයුතු වෙනුවෙන් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

## 2.14 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 514.95 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.518,055 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 84 | 67 | 17 |
| (ii) | තෘතියික මට්ටම | 28 | 05 | 23 |
| (iii) | ද්විතියික මට්ටම | 800 | 647 | 153 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 353 | | |
| (v) | කොන්ත්‍රාත් පදනම | 97 | 275 | 175 |
| | එකතුව | 1362 | 994 | 368 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) පුරප්පාඩු 368 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ii) අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ නොකර වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබාගෙන සේවය හැරගිය පර්යේෂණ හා සංවර්ධන සහකාර නිලධාරිනියෙකුගෙන් අයවිය යුතු රු.2,651,500 ක දණ්ඩන මුදල අයකර ගැනීමට අදාළව නීතිපති වෙත දැනුවත් කිරීම් සිදුකර තිබුණද 2018 ජූනි මස වන විටත් නීතිපති දෙපාර්තමේන්තුව විසින් සුදුසු පියවරයන් නිර්දේශ කර නොතිබුණු බැවින් දණ්ඩන මුදලද අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) කාර්ය මණ්ඩල පුහුණු කිරීම

දෙපාර්තමේන්තුවේ තනතුරු 05 කට අදාළ නිලධාරීන් 90 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළ කිසිදු පුහුණුවීමක් ලබාදී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 17 ක් ඇතුළුව පුරප්පාඩු 271 ක් පැවතීම ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ප්‍රගතිය සියයට 48 ක් පමණ වීම සඳහා මූලික වශයෙන් බලපා තිබුණි.

## 2.15 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 අනුව හා රජයේ ඇප ආඥා පනත යටතේ ඇප තැබිය යුතු වුවත් මාතලේ පර්යේෂණ ආයතනයේ නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.